# අවලෝකිතේශ්වර බෝධිසත්ව වන්දනය


## සහ බැඳුණු


# තාරා දෙවඟන වන්දනය

**මහායාන පිළිම සම්ප්‍රදායට අයත් වන තවත් ඉතා ප්‍රකට ප්‍රතිමාවක් ලෙස තාරා දෙවඟන නිරූපණය කරන ප්‍රතිමා දැකිය හැකිය. තාරා දෙවඟන ලෙසින් පුරාවිද්‍යාඥයින් සහ කලා විචාරකයන් විසින් හඳුන්වන මෙම ප්‍රතිමාව කුරුණෑගල දිස්ත්‍රික්කයේ තලම්පිටිය ප්‍රදේශයෙන් හමුවිය. ලෝකඩවලින් නිරූපිත මෙම ප්‍රතිමාව සමාධි මුද්‍රාවෙන් නිරූපිතය. මෙහි උස සෙන්ටිමීටර් 20 කි. ක්‍රිස්තු වර්ෂ 9 හා 10 සියවස්වලට අයත්වන මෙම තාරා දෙවඟනගේ ප්‍රතිමාව කොළඹ ජාතික කෞතුකාගාරයේ තැන්පත් කර ඇත.**









මෙම ප්‍රතිමාව (තාරා) අවලෝකිතේශ්වර බෝධිසත්වයන්ගේ සහායිකාව ලෙසින්ද හැඳින්වේ. අවලෝකිතේශ්වර බෝධිසත්වයන්ගේ භාර්යාව වන තාරා දෙවඟන එම බෝධිසත්වයන්ගේ වේශයෙන්ම ඊට අනුරූප වන වේශයෙන් පෙනී සිටී. ප්‍රධාන වශයෙන් යෝගී අවලෝකිතේශ්වර බෝධිසත්වයන්ට අනුරූප තාරා ප්‍රතිමාවල ආභරණ පළඳවා නැත. රාජකුමාර අවලෝකිතේශ්වර ප්‍රතිමාවලට අනුරූප තාරා ප්‍රතිමාවල ආභරණ ද වෙයි.

(මූර්ති කලාව- පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ශත සංවත්සරය වෙනුවෙන් (1890 - 1990) පළ කළ ග්‍රන්ථය - සංස්කාරක ආචාර්ය නන්දදේව විජේසේකර පි. 71)

විශාලතම තාරාදේවඟනගේ ප්‍රතිමාව බුදුරුවගල පිහිටි ප්‍රතිමා (අල්ප උන්නත) අතර ඇති ඉතා විශාලතම තාරා දෙවඟනගේ ප්‍රතිමාව නෙළා තිබේ. බුදුරුවගල බුදු පිළිමයට දකුණු පස පිහිටි අවලෝකිතේශ්වර මූර්තියට වම් පසින් මෙම තාරා දෙවඟනගේ ප්‍රතිමාව පිහිටි ගලෙහි (අල්ප උන්නතව) නෙළා ඇත. මෙය දැනට හමුවී ඇති විශාලතම තාරා දෙවඟනගේ මූර්තිය ලෙසට සඳහන්වේ. (ඉහත සඳහන් ග්‍රන්ථය පි. 71)

ඉහත සඳහන් කරන ලද වැල්ලවායේ බුදුරුවගල අසළ නෙළා ඇති තාරාදෙවඟනගේ විශාලතම පිළිමය (අල්ප උන්නත) බිසෝබණ්ඩාර නමින් තවමත් ලංකාවේ වන්දනා කෙරේ. තාරා දෙවඟනගේ ප්‍රතිමාව අවලෝකිතේශ්වර බෝධිසත්ව ප්‍රතිමා සමග ක්‍රිස්තු වර්ෂ 14 වන සියවස අයත් පුදබිම්වල පූජාවට ලක්වූ බව මහාචාර්ය නන්දසේන මුදියන්සේ මහතා විසින් සඳහන් කර ඇත.

### ජාතික කෞතුකාගාරයේ ඇති තාරා දෙවඟනගේ ප්‍රතිමාව

මෙම තාරා දෙවඟනගේ මූර්තිය (ලෝකඩ) හිඳි පිළිමයකි. පාද තබාගෙන ඇති ආකාරය හඳුන්වන්නේ වීරාසන මුද්‍රාව ලෙසටය. ධ්‍යාන හෝ සමාධි ඉරියව්වෙන් නිමවා ඇති මේ පිළිමයට අයත් මකුටය (හිස් පලඳනාව) මකර හිස්වලින් හා නෙළුම් මල්වලින් සරසා ඇත. එහි ඉදිරි පස කුහරය හිස්ව ඇත. එහි විශාල මැණිකක් හෝ කිසියම් සංකේතයක් තිබෙන්නට ඇතැයි සැලකේ. මුනිවරයින්ට අයත් වන ඉතා සරළ යටිකය වස්ත්‍රයක් මිස කිසිදු සැරසිල්ලක් එහි දක්නට නැත. අවලෝකිතේශ්වර බෝධිසත්ව පිළිමවල මෙන් ආභරණවලින් සැරසී නැත. උඩුකය නිරුවත්ව ද අඩක් වැසුණු දෑසින්ද යුතු මෙම පිළිමයේ මුහුණුවර තැන්පත් බවක් දක්වයි. කාන්තා ලක්ෂණවලින් නිරූපිත මෙම ප්‍රතිමාව සංවර පෙනුමකින් ද ගැඹුරු සමාධිගත ස්වරූපයෙන්ද යුක්ත බව පුරාවිද්‍යාඥයින් විසින් පෙන්වා දී ඇත.

### මාලාකාර දෙවඟන

මෙම තාරා දෙවඟනගේ ප්‍රතිමාව මන්නාරමෙන් හමුවූ ප්‍රතිමාවකි. රිදී මිශ්‍රිත ඝන වාස්තු ක්‍රමයට නිමවා ඇති මෙම ප්‍රතිමාව මීට ඉහතින් දක්වන ලද තාරා දෙවඟන ප්‍රතිමාවලට වඩා විශේෂත්වයක් පෙන්නුම් කරයි. මෙම ප්‍රතිමාවද වීරාසන මුද්‍රාවෙන් යුක්තය. (පාද තබාගෙන සිටින ආකාරය) මෙම මාලාකාර නමින් හඳුන්වන ලෝකඩ ප්‍රතිමාවේ හිසත් ශරීරයත් වම් පසට ඇලවී ඇති බව පෙනෙනු ඇත. ඇය බලා සිටින්නේ දකුණු දෙසය. මෙය නිර්මාණය කර ඇති ඉරියව්ව ද අත දරා ඇති භාණ්ඩයද අනුව මෙය බෞද්ධ දෙවඟනන් සමූහයට අයත්වන බව මේ පිළිබඳ පුරාවිද්‍යාඥයින් හා කලා විශේෂඥයින්ගේ මතයයි. නැමුණු වරපටක් දරා සිටින මෙම ලෝකඩ ප්‍රතිමාවෙහි එම වරපට මල්දමයක් හෙවත් මල් වැලක් වීමටද ඉඩ ඇත. මෙහි නිරූපිත තාරා දෙවඟනගේ ප්‍රතිමාවට විශේෂ ආභරණ ද පලඳවා ඇත. (හෙළ කලා විස්කම් - සිරිසමන් විජේතුංග පි. 86 - 102 2010)

### බ්‍රිතාන්‍ය කෞතුකාගාරයේ ඇති තාරා දෙවඟනගේ අගනා ලෝකඩ ප්‍රතිමාව

රන් ආලේප කර ඇති විශාල ලෝකඩ තාරා මූර්තිය ලංකාවෙන් ගෙන ගොස් බ්‍රිතාන්‍ය කෞතුකාගාරයේ තබා ඇත. එය බ්‍රිතාන්‍ය කෞතුකාගාරයට පරිත්‍යාග කළේ 1830 දී සර්. ජී. බ්‍රවුන්රිග් විසිනි. පත්තිනි රූපයක් ලෙස හඳුන්වන ලදී. මහාචාර්ය දෙහාජියන් මෙය අට වැනි සියවසේ ආරම්භක සමයත් මැද භාගයක් අතර කාලයට අයත් යැයි සඳහන් කරයි. ඔහු පෙන්වා දෙන පරිදි මෙය මාමල්ලපුරම් හි අදිවරාහ ලෙනේ II වැනි නරේන්ද්‍ර වර්මන්ගේ කාලයේ (8 වැනි සියවස) තනනු ලැබ 9 වන සියවසේදී ලංකාවට ලැබුණක් වන්නට ඉඩ තිබේ. එසේ නොවේ නම් පළවැනි සේන රජු සිහසුනට පත් ක්‍රි.ව. 833 ආසන්න කාලයක පල්ලව ශිල්පීන් ලවා එය ශ්‍රී ලංකාවේදී තනවන්නට ඇත. ආභංග ඉරියව්වෙන් යුත් තාරා දෙවඟන ප්‍රතිමාව දකුණු අතින් වරද මුද්‍රාවත් වමතින් කටක හස්ත මුද්‍රාවත් නිරූපිතය. යටිකය ධෝතියකින් සරසා ඇත. එහි උඩුකය විවෘතය. ආභරණ නැත. හිසේ ජටා මකුටය වෙයි. (මූර්ති කලාව මූර්ති කැටයම් - ක්‍රි.ව. 500 - 1000 මහාචාර්ය චන්ද්‍රා වික්‍රමගමගේ සංස්කාරක ආචාර්ය නන්දදේව විජේසේකර පි. 71- පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයකි.)

**පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ හිටපු සහකාර පුරාවිද්‍යා අධ්‍යක්ෂ**

**■ සිරිසමන් විජේතුංග**